# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 2 ශ්‍රේණිය - පරිසරය( අගෝස්තු-2 සතිය)

## 11 තේමාව - අපට ඕනෑ දේ ලැබෙන හැටි

දුවේ පුතේ ඔබ දන්නවාද?

අපට අවශ්‍ය භාණ්ඩ මිල දී ගත හැකි ස්ථාන;

| | |
|---|---|
| සුපිරි වෙළඳ සැල | සපත්තු අලෙවිහල |
| පොළ | ෆාමසිය |
| සිල්ලර කඩ | පොත්හල |

අපේ මූලික අවශ්‍යතා අතර ජලය ද ප්‍රමුඛ වේ. සමහර ප්‍රදේශවල සිටින මිනිසුන් ජලෞඅ සඳහා ද යම් ගෙවීමක් කරනු ලබයි.එලෙස නිවසට බාහිරින් අපේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුද්ගලයින් පැමිණේ. ඔවුන් අතර ..

1. ජල බිල්පත් මනු කියවන්නා
2. විදුලි බිල්පත් මනු කියවන්නා
3. ලියුම් බෙදාහරින තැපැල් කරු
4. පත්තර බෙදන තැනැත්තා

මොවුන් සමග හැසිරීමේදී පුංචි ඔබ කුඩා කල සිට ම

- සුහද ව කතාබහ කිරීම
- ඉවසීමන් හා සහයෝගයෙන් කටයුතු කිරීම
- ඔවුන්ගේ සේවය අගය කිරීම

ඔබ වෙළඳපොළ ට බඩු මිලදී ගැනීමට දෙමව්පියන් සමග යනවා නේද? බඩු ගෙන ඒමට රැගෙන යන්නේ මොනවාද?

..................................................................................................................................

පුංචි දුවේ පුතේ, වෙළඳපොළට යන විට රෙදි මල්ලක් රැගෙන යන්න. නැතිනම් පොලිතින් මලු වලට දමා භාණ්ඩ දෙනවා නේද? අපේ පරිසරය මේ පොලිතින් නිසා හානි වෙනවා.